දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ අංකය:40/2013

මගේ අංකය - කේ.03/51/267 /13.
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2013.11.09 වෙනි දින.

සියලුම බන්ධනාගාර අධිකාරින්,
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත.

**2014 වසරට ආගමික වතාවත් සිදුකිරීම සඳහා පූජකවරුන් පත්කිරීම**

2014 වසර සඳහා දිවයිනේ සියලුම බන්ධනාගාර ආයතනවල රඳවා ඇති එක් එක් ආගමට අයත් සිරකරුවන් හට ආගමික වතාවත් සිදුකිරීම සඳහා පූජකවරුන් පත්කල යුතුව ඇත.

02. ඒ සඳහා පහත සඳහන් ආදර්ශයට අනුව , සකස්කල පූජකවරුන්ගේ නාම ලේඛණයක් 2013.12.15 වෙනි දිනට පෙර ඔබගේ නිර්දේශය සහිතව මා වෙත එවිය යුතුය.

03. 2013 වර්ෂයට පත්කර ඇති පූජකවරුන්ගේ නිල කාලය 2013.12.31 වෙනි දිනට අවසන් වන බැවින් , 2014 වසරට අලුතින් පූජකවරුන් පත්කිරීමට අවශ්‍ය විස්තර සැපයීමට ආයතන භාර අධිකාරි වරයා / සහකාර අධිකාරි වරයා විසින් වග බලා ගත යුතුය. මේ වන විට පත්කර ඇති පූජකවරුන් කොපමන වාරයක් බන්ධනාගාරයට පැමිණ ආගමික වැඩසටහන් ඉටුකලාද , නැද්ද යන්න සහ ඒ අනුව ඔවුන්ගේ ආගමික මෙහෙවර තවදුරටත් බන්ධනාගාරයට ප්‍රයෝජනවත්ද යන්න පිළිබඳව ඇගයීමක් කොට එම පූජකවරුන්ගෙන් යම් අයෙකු හෝ කණ්ඩායමක් ආයතනයේ නේවාසිකයින් හට ආගමික කටයුතු සිදුකරගෙන යාමට සුදුසු නොවෙන බවට ඔබ විසින් සෑහීමකට පත්වන්නේ නම් ඔවුන්ගේ නම් ඉවත් කිරීමට හේතුද සඳහන් කල යුතුය. මීට අමතරව අලුතින් පත්කරන පූජකවරුන් වේ නම් ඔවුන් පත්කිරීමට හේතුවන කරුණුද සංක්ෂිප්තව සටහන් කල යුතුය. තවද , ආයතනයේ රඳවා සිටින සියළුම සිරකරුවන් / සැකකරුවන් වෙනුවෙන් ඔවුන් අදහන ආගමට අනුව සිටින සංඛ්‍යාවට සරිලන පරිදි පූජකවරුන් පත්කිරීම සඳහා අවශ්‍ය විස්තර සැපයීම ආයතන භාර අධිකාරි /සහකාර අධිකාරි වරයාගේ වගකීම බව සඳහන් කරමි.

04. එල්.ටී.ටී.ඊ සැකකරුවන් රඳවා සිටින ආයතන සඳහා පත්කිරීමට නිර්දේශ පූජකවරුන් වෙනුවෙන් පොලිස් වාර්තා ලබාගෙන අදාල නාම ලේඛන සමඟ ඉදිරිපත් කිරීම සිදුකල යුතු අතර , පසුගිය වසරේ පත්කරන ලද පූජකවරුන්ගේ නම් ලැයිස්තුවට අනුකූලව ආගමික කටයුතු පැවැත්වීම සඳහා සුදුසු පූජකවරුන් අදාල ආගමේ ප්‍රධාන පූජකවරයා සමග සාකච්ඡා කර තෝරාගෙන එසේ තෝරාගත් නම් පමණක් ආයතන භාර අධිකාරි වරයාගේ නිර්දේශය සහිතව එවීමට කටයුතු කල යුතුය.

05. 2013 වසර සඳහා පූජකවරුන් පත්කිරීමේ නාම ලේඛණය සමහර ආයතන අධිකාරි වරුන් විසින් නියමිත දිනට මූලස්ථානයට නොඑවීම හේතුවෙන් පූජකවරුන් පත්කිරීමේදී දැඩි අපහසුතාවයන්ට මුහුණ පෑමට සිදුවූ බැවින් 2014 වසරේ පූජකවරුන් පත්කිරීමේ නාම ලේඛනය නිසියාකාරව සකසා නියමිත දිනට පෙර එවීමට ඔබ විසින් වගබලා ගත යුතු බව වැඩිදුරටත් දන්වමි.

2013 වසර සඳහා පූජකවරුන් පත් කිරීම

............................................ බන්ධනාගාරය

| බෞද්ධ | කතෝලික | ඉස්ලාම් | මෙතෝදිස්ත | හින්දු | වෙනත් ආගම |
|---|---|---|---|---|---|
| | | | | | |

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්